**ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) - 2019**

**---------------------------------------------------------------------------------**

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යයනය) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ගවල කිලෝමීටර් 62 ක් වැඩිදියුණු කිරීම, පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් මගින් ජාතික ප්‍රවාහන පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,728 කට සමාන එ.ජ.ඩො. මිලියන 105.60 ක් වන අතර ඉන් රු. මිලියන 11,050 කට සමාන එ.ජ.ඩො මිලියන 85 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 2,678 කට සමාන එ.ජ.ඩො මිලියන 20.6 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2017 සැප්තැම්බර් 11 දින අවසන් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 එස්ආර්අයි දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලද ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍ය සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් 14 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිත අතර 2017 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දක්වා ඇවර කිරීමකින් තොරව එහි කටයුතු සිදුකර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කරන ලද කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද ඇවර කිරීමකින් තොරව ව්‍යාපෘතිය විසින් එහි කටයුතු 2019 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි. ණය ගිවිසුමේ සඳහන් ව්‍යාපෘතියේ කටයුතු සීමා කිරීම සඳහා ඇතුලත් කරන ලද සීමාවන් නොසලකා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත පදනම්ව පිළියෙල කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදි අයුරින් යොදාගෙන ඇත. | නොපියවන ලද ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගෙවීම් පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ඇවර කිරීමේ තීරණය අනපේක්ෂිත වේ. සියළුම සම්මුතික බැඳීම් අවසන් කිරීමෙන් පසු සියළුම මාර්ග කොටස්වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇත. | ව්‍යාපෘතියේ කටයුතු අවසන්කළ වහාම ව්‍යාපෘතියේ සියළුම වත්කම් හා වගකීම් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත මාරු කර ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හික්කඩුවෙන් සහ අළුත්ගමින් දක්ෂිණ අධිවේගී මාර්ගයට ඍජුවම සම්බන්ධවන ජාතික මාර්ග 2ක් සහ මාතර - ගොඩගම මාර්ගය, කටුකුරුන්ද - නාගොඩ මාර්ගය, නුගේගොඩ - හෝමාගම මාර්ගය හා පාමංකඩ - කැස්බෑව මාර්ගය යන වෙනත් ජාතික මාර්ග 4ක කිලෝමීටර් 62ක් වැඩිදියුණු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ යලි සම්බන්ධ කිරීමට සැලසුම් කරන ලදී. කෙසේවෙතත් 2016 දෙසැම්බර් 31 වන විටත් එම මාර්ගවල කිලෝමීටර් 55.72ක් පුනරුත්ථාපන කටයුතු නිමකර තිබුණි. මාතර - ගොඩගම මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඉලක්කගත කාලය තුල නිමකර තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩබිම් භාරදීමේ ප්‍රමාදයන්, තක්සේරු කිරීම හා ඒ සම්බන්ධ වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදයන්, උපයෝගීතා සේවා මාරුකිරීමේ ප්‍රමාදය සහ විෂයපථය වෙනස්වීම වැනි විවිධ හේතූන් නිසා අනෙකුත් මාර්ගයන් දින 172 සිට දින 338 ප්‍රමාදයන් සහිතව නිමකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුගේ බිල්පත් වලින් එකතුව රු. මිලියන 128 ක ප්‍රමාද ගාස්තු අඩුකර තිබුණු අතර පසුව කාලය දීර්ඝ කිරීම සඳහා ඉඩදීම මගින් එම මුදල ආපසු ගෙවා තිබුණි.

### 3.2 පරිබාහිර ගනුදෙනු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය දකුණු පළාතේ ගාල්ල- බද්දේගම මාර්ගයේ කිලෝමීටර 17.6ක් පුනරුත්ථාපනය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් එකතුව රු. මිලියන 18.33 ක් වියදම්කර තිබුණද ඒ සම්බන්ධ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මාර්ගයේ අදාල කොටසේ පුනරුත්ථාපන කටයුතු සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ විසින් දරන ලද වියදම් වෙනත් අරමුණු ලගාකර ගැනීම සඳහා භාවිතාකර ඇත. | ගාල්ල- බද්දේගම මාර්ගය දක්ෂිණ මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් සැලැස්ම තුල මුල් මාර්ගයක් විය. ගිවිසුම් අත්සන් කරන තෙක් ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මාර්ග සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්මේ මෙම මාර්ගය මූලික මාර්ගයක් විය. අරමුදල්වල සීමා සහිතබව නිසා මෙම මාර්ගය ඉදිකිරීමේ වැඩ ආරම්භ කර නොමැත. | ව්‍යාපෘතියේ විෂය පථයට අනුගතවීම අවශ්‍ය වේ. |

### 3.3 ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලබා දී ඇති තොරතුරු අනුව, රජයේ ඉඩම් කොටස් 1,362 ක් ඇතුළුව ඉඩම් කොටස් 7,702 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. එම නිසා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 4,427 ක් සඳහා රු. මිලියන 5,870 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. එයට අමතරව 2019 දෙසැම්බර් 31 දක්වා ඉඩම් කොටස් 2,460 ක් වෙනුවෙන් වන්දි ගෙවීම ප්‍රමාදවීම මත එකතුව රු. මිලියන 109.76 ක මුදලක් පොලී වශයෙන් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 1986 අංක 13 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ හා නිරවුල් කිරීමේ පනතේ 44වන වගන්තිය යටතේ 2019 දෙසැම්බර් 31 දිනට කිසිදු ඉඩම් කොටසක අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු හා අමතර පිරිවැයක් දැරීමට සිදුවිය හැකිය. | ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමට පෙර අත්පත් කර ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු පොළිය සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුය. කෙසේ වුවද, පනතේ 44 වන වගන්තිය යටතේ මාතර - ගොඩගම මාර්ගයේ ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |

### 3.4 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| සිවිල් ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ණය නියෝජිත ආයතනය මගින් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 7.20 ක් නියෝජනය කරන රු. මිලියන 923 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.12 ක ප්‍රතිපාදන ව්‍යාපෘති කාලය අවසාන වන විටදී උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණු අතර අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීමකින් තොරව 2017 සැප්තැම්බර් 11 දින ණය නියෝජිත ආයතනය වෙත ප්‍රේෂණය කර තිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට නොහැකිවේ. | සියළුම ඉදිකිරීම් කටයුතු සැලසුම් කල පරිදි සිදු කර ඇති අතර මෙම වටිනාකම ඉතුරුම් වේ. | ව්‍යාපෘති කාලසීමාව තුළදී කටයුතු සම්පූර්ණ කිරීමට හැකිවන ආකාරයට ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි සැලසුම් කළ යුතුය. |